)ම්ලූම් ලැම්ලු!දි ඊම්ඊම්ම්
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

# ඉතිහාසය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- අංක 01 05 දක්වා වූ ප්‍රකාශනවලට ගැලපෙන වචන යොදා හිස්තැන් පුරවන්න.

01 සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යනු ........................................................ සිටි දාර්ශනිකයින් තිදෙනෙකි.

02 මුහම්මද් නබි තුමා ................................................................ දෙවියන්ගේ පණිවුඩය තම අනුගාමිකයින්ට දේශනා කළේය.

03 ශ්‍රී ලංකාවට කිට්ටුවෙන්ම පිහිටි දකුණු ඉන්දියානු රාජ්‍යය වන්නේ ............................................................ රාජ්‍යයයි.

04 පළමුවන විජයබාහු රජතුමා සොළීන් පළවාහැර ...................................................... තම අගනුවර කර ගත්තේ ය.

05 හයවෙනි පරාක්‍රමබාහු රජතුමා ..................................... රාජ්‍යයේ කීර්තිමත්ම පාලකයා වේ.

- අංක 06 10 දක්වා වූ ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 ගම්පල රාජධානි යුගයේ දී ප්‍රභූරාජ නිශ්ශංක අලගක්කෝනාර විසින් කෝට්ටේ බලකොටුවක් ගොඩනංවන ලදී. ( )

07 ඉස්ලාම් ආගමේ ඉගැන්වීම් අනුව මුස්ලිම්වරු ඉරිදා දිනයේ දී දේවස්ථානයට ගොස් ආගමික වතාවත්වල යෙදිය යුතුවේ. ( )

08 සූරතිස්ස රජතුමාගේ කාලයේ දී සොළී රටෙන් පැමිණි එළාර නම් කුමාරයෙක් අනුරාධපුර රාජ්‍යය පැහැර ගත්තේ ය. ( )

09 පොළොන්නරු රාජධානිය බිඳවැටීමට ආසන්නතම හේතුව කාලිංගමාඝගේ ආක්‍රමණයයි. ( )

10 ක්‍රිස්තුස් වහන්සේ දේශනා කළ ධර්මය කුරාණයෙහි අන්තර්ගත වී ඇත. ( )

● හිස්තැනට ගැලපෙන වචනය වරහන් තුළ ඇති පිළිතුරු අතුරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11 ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය අධිරාජයා ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේ .................................................... රජතුමාගේ කාලයේ දී ය. (වංකනාසිකතිස්ස / ගජබාහු / පළමුවන සේන)

12 කොලෝසියම් ක්‍රීඩාගාරය පැරණි ........................................................ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ට ලක්ෂණ පෙන්නුම් කරයි. (රෝම / ග්‍රීක / අරාබි)

13 පිඟන් භාණ්ඩ හා මැටි භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධව .............................................. ශිෂ්ටාචාරය අතීතයේදීත් ඉතා ප්‍රසිද්ධ විය. (ඉන්දු නිම්න / හොවැංහෝ / ඊජිප්තු)

14 පැරණි මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා තිබූ ප්‍රදේශය වර්තමානයේ .......................................... නමින් හඳුන්වනු ලැබේ. (ඊජිප්තුව / පාකිස්ථානය / ඉරාකය)

15 පසුකාලීන ලෝකයට ඉතා වැදගත් දායාදයක් වූ නීති පද්ධතියක් සකස් කිරීමට ක්‍රියා කළේ .................................................... නම් රෝම අධිරාජයාය. (කොන්ස්ටන්ටයින් / ජස්ටිනියස් / නීරෝ)

● ගැළපෙන පරිදි A හා B තීර යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| 16 | එක්දහස් එක් රැය | A | පළමුවන විජයබාහු රජුට සිටි විරුද්ධවාදියෙකි. |
| 17 | අවුකන හා තොළුවිල ප්‍රතිමා | B | ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්ති ස්ථානයයි. |
| 18 | ලෝකේශ්වර | C | අරාබිවරුන්ගේ ශ්‍රේෂ්ට නවකථාවකි. |
| 19 | කඳවුරු නුවර | D | අමරාවතී කලා සම්ප්‍රදාය නිරූපණය කරයි. |
| 20 | පලස්තීනය | E | අනුරාධපුර යුගයේ දී පොළොන්නරුව හැඳින්වීමට මේ නමද යොදාගෙන ඇත. |

(2 x 20 = 40)

The National e-learning Portal for The General Education

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01 (1) තුන්වන වාරයේ දී ඉතිහාසය විෂය සම්බන්ධයෙන් ඔබේ පංති කාමරය තුළ ක්‍රියාත්මක කළ ඇගැයීම කුමක් ද?

(2) ඔබ ඊට සහභාගි වූයේ කෙසේදැයි ලියන්න.

(3) ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක් ද?

(4) ඔබේ කණ්ඩායම ලකුණු රැස්කරගත්තේ කෙසේද?

(5) ඇගැයීම පිළියෙල කිරීමේ දී ඇතිවූ ගැටළුවක් ඉදිරිපත් කරන්න.

(6) ලකුණු දීමේ දී ගුරුතුමා / ගුරුතුමී අනුගමනය කළ ක්‍රමය පැහැදිලි කරන්න.

(7) ඉදිරියේ දී ඇතිවිය හැකි ගැටළු අවම කරගැනීමට ක්‍රමයක් යෝජනා කරන්න.

(8) ඉහත ඇගැයීම් ක්‍රියාවලිය නිසා ඔබට ඇතිවූ ප්‍රයෝජනයක් ලියන්න.

02 (1) පොළොන්නරුව ආක්‍රමණය කළ කාලිංගමාඝ අනුගමනය කළ විනාශකාරී ප්‍රතිපත්ති 2 ක් ලියන්න.

(2) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසුව නිරිතදිග ප්‍රදේශවල බිහිවූ රාජධානි අගනුවර හතරක් නම් කරන්න.

(3) කෝට්ටේ රජකම් කළ හයවෙනි පරාක්‍රමබාහු රජතුමා දිවයින එක්සේසත් කිරීම පිණිස අනුගමනය කළ ක්‍රියාමාර්ග 5 ක් ලියන්න.



03 (1) (a) දකුණු පස ඉදිරිපත් කර ඇති පින්තූරයේ පෙන්නුම් කරන නිර්මාණය කවර ශිෂ්ටාචාරයකට අයත්වී ද?

(b) එය කවරකුගේයයි විශ්වාස කරනු ලැබේද?

(2) පිරමීඩ තැනීමෙන් තහවුරු වන්නේ නයිල් මිටියාවතේ ජනයා මරණින් මතු ජීවිතය පිළිබඳව විශ්වාස කළ බවයි. පිරමීඩ තැනීමෙන් ඔවුන් ඉටුකරගැනීමට බලාපොරොත්තු වූ අරමුණු 2 ක් දක්වන්න.

(3) පැරණි ග්‍රීසියේ පැවැති පෞර රාජ්‍යයන් පිළිබඳව ඔබ දන්නා කරුණු 5 ක් ලියන්න.

04 (1) සොළොස් මහා ජනපද අවධියේ ඉන්දියාවේ පැවැති රාජාණ්ඩු 2 ක් නම් කරන්න.

(2) එකල එරටේ ක්‍රියාත්මක වූ චතුර්වර්ණ නම් කර එක් එක් වර්ණයට අයත් වූ එක් කාර්යයක් බැගින් ලියන්න.

(3) (a) රෝම ශිෂ්ටාචාරයේ වන්දනාවට භාජනය වූ දෙවිවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(b) රෝමවරුන්ගේ වෙළඳ කටයුතු ගැන කරුණු 3 ක් ඉදිරිපත් කරන්න.

05 (1) පොළොන්නරු රාජධානි සමයේ දී මෙරට පාලන කටයුතුවලට සම්බන්ධ වූ කාන්තාවන් දෙදෙනෙක් නම් කරන්න.

(2) (a) පහතින් දක්වා ඇති පින්තූරයේ පෙන්නුම් කරන නිර්මාණය කුමක් ද?



(b) එය කරවූ රජතුමා කවුරුන් ද?

(3) පළමුවන විජයබාහු රජතුමාගෙන් රාජ්‍යයට සිදුවූ සේවාව දැක්වීමට කරුණු 3 ක් ලියන්න.

06 (1) මධ්‍යකාලීන යුරෝපයේ බොහෝ රටවල ක්‍රියාත්මක වූයේ වැඩවසම් පාලන ක්‍රමයයි. වැඩවසම් ක්‍රමයේ ආරම්භයට බලපෑ විදේශ ආක්‍රමණ 2 ක් ලියන්න.

(2) එකල වැඩවසම් සමාජය තුළ දක්නට තිබූ ලක්ෂණ 2 ක් දක්වන්න.

(3) (a) කුරුස යුද්ධය යනුවෙන් හැඳින්වෙන්නේ මොනවාද?

(b) කුරුස යුද්ධ නිසා ඇතිවූ ප්‍රතිඵල 3 ක් ලියන්න.